# 6 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## ඒකකය 3

## මෙහෙයුම් පද්ධති හා ගොනු හැසිරවීම




කියවීම් ද්‍රව්‍ය




# මෙහෙයුම් පද්ධතිය හඳුනා ගනිමු

# මෙහෙයුම් පද්ධතියක් යනු ?




- මෙහෙයුම් පද්ධතියක් යන,පරිගණක මෘදුකාංගයකි. එනම්, පරිගණක වැඩසටහනකි.
- මෙමගින් පරිශීලකයා හා පරිගණක දෘඩාංග අතර සම්බන්ධයක් ඇති කරයි.
- එමෙන්ම, අනෙකුත් මෘදුකාංග පාලනය කිරීම ද සිදු කරයි.

# මෙහෙයුම් පද්ධතිය උදාහරණයක් මගින් පැහැදිලි කිරීම

උදාහරණයක් ලෙස ආයතනයක් සලකමු.




කළමණාකරු, ව්‍යාපාරයට අවශ්‍ය පරිදි සේවකයින් මෙහෙයවන අයුරින් මෙහෙයුම් පදිධතිය පරිගණකයේ දෘඩාංග හා මෘදුකාංග මෙහෙයවයි.

සමහර අවස්ථාවන් හි දී ආයතනයේ කළමණාකරුවන් වෙනස් වන ආයුරින්, මෙහෙයුම් පද්ධතියක් වෙනස් කිරීමට ද හැකි ය.
උදා - Windows, Ubuntu, Android, Mac OS, Linux

# විවිධ මෙහෙයුම් පද්ධති

මේ වන විට ලොව මෙහෙයුම් පද්ධති ගණනාවක් පවතින අතර, ජනප්‍රියතම මෙහෙයුම් පද්ධති කිහිපයක් පහත පරිදි වේ. මේවායින් සමහරක් මෙහෙයුම් පද්ධති, බලපත්‍ර ලාභී මෘදුකාංග වන අතර සමහරක් නිදහස් මෘදුකාංග යි.

Windows Mac OS Android OS Linux OS Ubuntu OS

# පරිශීලක අතුරු මුහුණත (User Interface)

- මෙහෙයුම් පද්ධතිය මගින් පරිශීලකයාට සිය කටයුතු කරගෙන යාම සඳහා අතුරු මුහුණතක් ලබා දේ.
- පරිශීලකයා තම කටයුතු මෙහෙයුම් පද්ධතිය මගින් ඉටුකරගෙන යාමට පරිශීලක අතුරු මුහුණත (User Interface) යොදා ගනී.

